## හඳපාන්ගොඩ උපනන්ද බටුගෙදර 1918 - 1980

**පළමුව ගමේ පාසලින් ද දෙවනුව කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් ද අවසාන කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ද අධ්‍යාපනය ලබා කොලොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාවෙන් විශේෂ පුහුණුවක් ලත් උපනන්ද වෘත්තියෙන් රජයේ පාලම් අංශයේ අධිකාරිවරයෙකු වූ බව ඔහුගේ චරිත කථාව විවරණය කර ඇත.**



# හඳපාන්ගොඩ උපනන්ද බටුගෙදර

## හෙළ කවියේ නොමැකෙණ ලකුණ

මහාචාර්ය
ඇස්. බී. හෙට්ටිආරච්චි

කොළම යුගයේ කවියන් අතර සුපතල නමක් රැඳි හඳපාන්ගොඩ උපනන්ද බටුගෙදර කවියාගේ දූ - පුතුන් පස් දෙනාගෙන් වැඩිමහල් දියණිය වූ විසුද්ධි දිනක් මට පත්තර කෑලි තොගයක් රැගත් පයිල් කවරයක් අතට දී තාත්තී ගැන ලිපියක් ලියා දෙන්නට යැයි ඉල්ලා සිටියා ය. ඒ පත්තර කෑලිවලින් වැඩිහරියක් අතට දිය වී යෑමෙන් අයි න්වල තැන් තැන් ලෙහී ඉරී ගිය ඒවා ය. සමහරක් කාලයාගේ හස්තයට අසුව අවපැහැගත් ඒවා ය. ඒ කෙසේ වුවත් මා එය අතට ගත්තේ සොම්නසින් ඉපිලී ගිය හදකිනි. ඒ උපනන්දගේ කවි ද රැගත් පත්තර සඟරා මාගේ පොත්ගුලේ නොතිබූ නිසා නොවේ. එය පියෙකුට දියණියක් තුළ තිබූ සෙනෙහස පිළිබිඹු කරන කැටපතක් වූ නිසා ය : ඒ ලේඛන මිටිය උපනන්ද ගැන ලස්සන සිතුවමක් මවා පෑමට සමත් වෙතයි හැඟී යාම නිසා ය: අපට ද නිරාමිෂ වින්දනයක් ඒවා කියැවීමෙන් ලබා හැකි වේය යන විශ්වාසය සිත තඳළ ජනිත වීම නිසා ය. පත්තර කෑලි එහෙ මෙහෙ පෙරලා බැලූ විට ම මා සිතූ දේවල් නිවැරදි යැයි මට ඒත්තු ගියේ ය.

උපනන්ද ගැන හෝ ඔහු විසින් හෝ එතෙක් ලියා ඇති සියල්ලක් එම ලිපි ගොනුවේ නැති බව සැබෑ ය. එහෙත් උපනන්ද කියවීමට එය පමණ ය. උපනන්දගේ රචනාවලට වඩා උපනන්ද ගැන රචනා කළ දෙයින් එම ලියවිලි තොගය පිරී ගොස් තිබීම ඊට ප්‍රධාන හේතුව වේ. එහෙයින් මගේ කාර්යය ද පහස් විය. කවි කිවිඳියන් ඔහුට කෙතරම් ආදරය කළා ද? කාව්‍යවිචාරකයින් සම්මත කාව්‍යවිචාර විධි අනුව යමින් ඔහු කියැවීමට දැක් වූ විපීශීෂාවේ තරම කුමක් වීද ? යනාදිය හා ජනමාධ්‍යය තුළ කෙතරම් ජනප්‍රිය චරිතයක් වූවා ද යන කරුණු ඇති පමණට විදහා පෙන්වීමට එම ලියවිලි සම්භාරය හොඳටම පොහොසත් ය.

උපනන්ද අප අතරින් සදහට වියෝ වූ 1980 මාර්තු මස 29 වන දා සිය 2015 දක්වා වූ වසරවල ඔහු වියෝ වූ දිනය අලළා ලියා සිළුමිණ, දිවයින, ලංකාදීප, ජනතා ආදී ප්‍රසිද්ධ පුවත්පත් වල පළකරන ලද ගුණ සැමරු ගැදි පිදි රචනාවල කතුවරුන් වූවෝ ඉහළ පෙළේ කවි කිවිඳියෝ ය. ප්‍රබුද්ධ කාව්‍ය විචාරකයෝ යත ප්‍රශස්ත ලේඛකයෝ ය. ඔවුන් අතර මහාචාර්ය සුනන්ද මහෙන්ද්‍ර, කිවිපති කලාභූෂණ මර්වින් සේනාරත්න, ගුණදාස ලියනගේ, අනදපිය කුඩාතිහි, කේ.බී.සුගතදාස, කවුඩානේ පියදාස පෙරේරා, සරත්චන්ද්‍ර ජයකොඩි, නන්දසේන පලිහක්කාර, උඩුගොඩ සමරසේකර, සෝමපාල ජයකොඩි, අහංගම ආරියසේන, කමලා වික්‍රමසුරිය හා ගීතනාත් කුඩලිගම ආදීහු වෙති.

**පාලන් හදන මිනිහෙකුගේ තොල උඩට බෑගෙන්වන්න සරසවි හිටිවන වැඩට**

1980 මාර්තු මස 31 වෙනි සඳුදා දිවයින පුවත්පත එතුමාගේ අභාවය වාර්තා කරමින් මෙසේ ද සඳහන් කළේ ය. " ජ්‍යේෂ්ඨ කවියෙකු වූ හඳපාන්ගොඩ උපනන්ද බටුගෙදර කවියා නුගේගොඩ චැපල් පටුමගේ සිය නිවසේ දී අභාවප්‍රාප්ත විය.

"බටුගෙදර කවියා පාසැල් වියේ දීම සිංහල කවි මගට පා තබා සිටියේ ය. සිය පියාණන් වූ පැරණි නාට්‍ය ග්‍රන්ථ රචකයෙකු හා ගීත රචකයෙකු වූ හඳපාන්ගොඩ බී. ඇල් බෝපාධිපාලමහතාගේ දෙටු පුත් රුවන වූ බටුගෙදර කවියා සිංහල පුවත් පත් සඟරා වලට දහස් ගණන් පැදිවැල් රචනා කළා පමණක් නොව කඳුළු, වළාකුළු, අහි චාරිකාව වැනි පද්‍ය ග්‍රන්ථ ගණනාවක්ම ලියා පළ කළේ ය."

මෙහි දී කෘතවේදිව යමක් සඳහන් කළ යුතු ය. එනම් ඔහු ජිවත් වූ මාවත බටුගෙදර මාවත යනුවෙන් නම් කිරීමට අතුල පෙරේරා නාගරික මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව එවකට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරාධිපතිනි සෝමා ගලගල මහත්මිය ඇතුළු මන්ත්‍රීවරුන් විසින් පිළිගන්නා ලදුව 1987 පටන් එනමින් ව්‍යවහාර වන්නට වීමයි.

ශ්‍රී රූපදේව, ආනන්ද රාජකරුණා, බොරලැස්ගමුවේ ජී.එච්. පෙරේරා, කුමාරතුංග මුනිදාස, ගම්පහ ජ. ජේ වික්‍රමතිලක නොතාරිස් රාළහාමි වැනි වත්මන් යුගයේ වැජඹුණ මහකවියන්ගෙන් ද සම්මාන ලැබූ බටුගෙදර ඉතා දක්ෂ ලෙස හිටිවන කවි කීමෙහි දී ද කවියේ ශබ්දාලංකාරයක් වූ එළිවැට එළිසම අත් නොහළ එකම කවියා වශයෙන් හැඳින්විය හැකි ය.

1948 දී ප්ලොරන්ස් සමරදිවාකර මෙනෙවිය සමඟ බටුගෙදර විවාහ විය. ඇය වයස 46 දී අකල් මරණයකට ගොදුරු වූවාය. එයින් වසරක් ගිය තැන ඔබ නැතිව වසරක් යන මැයෙන් රිවිරැස පුවත්පතේ පැදිවැලක් පළ විය. මේ කවිය ද එහි වෙයි.

දර කෝටුවක් වුව තැබුවා නම් පොළො වේ
සුර තෙහි සීතලට දළු ලා ගෙ පැළවේ
මුර දේවතාවිය අද නැතියෙන් මෙලොවි
පෙර තිබු ගස් කොළන් ටික වුව අද මැළවේ

උපනන්ද සංවේදී කවියෙකු බව මේ කවියෙන් වුවද පැහැදිලි වේ. තම පියාණන් මියගිය පසු කඳුළු නමින් කවි පොතක් ලිවේත් නැගණියක නමට. අක්ක නගෝ යන පැදිවැල් ලීවේත් මේ සංවේදී බව නිසා යයි සිතමි.

ඔහු කවි ලිවා පමණක් නොව කවියන්ගේ සංවිධානවල සමාජිකයෙකු වශයෙන් ද කටයුතු කළේ ය. එපමණකින් නොනැවතුණු ඔහු 1972 දී අගනුවර තරුණ කවි සමාජයේ 10 වන සභාපතිවරයා වශයෙන් කළ සේවාව අගය කළ යුත්තක් වේ.

වත්මන් කවි රජදහනේ වනස්පතී යැයි විරුදාවලී ලත් ගොළුවාමුල්ලේ විමලසේ නයන් මා මෙම ලිපිය ලියාගෙන යන අතරතුර දුරකථනයෙන් කථා කොට මවිසින් ඔහුගේ කවිරස සඝරාවට යවන ලද කවි පෙළ ලැබුණ බව දන්වා සිටියේ ය. ඒ අවස්ථාවේ දී මම උපනන්ද ගැන ලිපියක් ලියමින් සිටින බව එතුමා ට පැවසීමි. උපනන්දගේ කවිත්වය හා මනුෂ්‍යත්වය මුව නොසැහෙන සේ අගය කළ ඔහුගේ මුවින් 1952 දී කොළඹ තරුණ බෞද්ධ සමිති ශාලාවේ දී පැවති හිටිවන කවි මඩුවේ දී උපනන්දගේ නිහැඬියාව ගැන මුලසුන ප්‍රශ්න කළ විට උපනන්ද දුන් පිළිතුරේ වූ පහත සඳහන් අවසන් දෙපදය ද ඉබේම පිටවිය.

**පාලන් හදන මිනිහෙකුගේ තොල උඩට**
**බෑගෙන්වන්න සරසවි හිටිවන වැඩට**

පළමුව ගමේ පාසලින් ද දෙවනුව කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් ද අවසාන කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ද අධ්‍යාපනය ලබා කොලොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාවෙන් විශේෂ පුහුණුවක් ලත් උපනන්ද වෘත්තියෙන් රජයේ පාලම් අංශයේ අධිකාරිවරයෙකු වු බව ඔහුගේ චරිත කථාව විවරණය කර ඇත. එය මෙම කවි දෙපදයට අටුවාවක් බඳු වෙයි. එමතු නොවන, පාලම් හැදීම සද්ද බද්ද පිරි ගොරෝසු වැඩකි. කවිය ඊට හාත්පසින් වෙනස් සුලලිත සුකෝමල දෙයකි. යකඩ ගොඩවල් මැදින් වුවද රසිකත්වය ගලා යන බව මේ දෙපදය තුළින් ව්‍යඞගයෙන් පැවසු හැටි අපුරු නොවේ ද? එය ඇත්ත වශයෙන් ම දැක්මකි. ඒ අනිකත් නොව රසිකත්වයට සීමා නැත යන්නයි.

1974 දී නුගේගොඩ කට්ටිය හන්දියේ දී ඔහුම පැද වූ රිය අනතුරට ලක්වීමෙන් ඔහු ආබාධිතයෙකු බවට පත්ව මිය යනතුරු ම සිටියේ රෝගියෙකු වශයෙනි. ඔහුගේ සුවදුක් බැලීමට ආ අය අතර අගමැති ආර්. ප්‍රේමදාස මහතා විය. මියැදෙන්නට දින 10ට පමණ පෙර සරත්චන්ද්‍ර ජයකොඩි විසින් ලියා ජනතා පුවත් පතේ පළ කළ උපනන්ද බටුගෙදර වෙතටයි යන මැයෙන් වූ ලිපියෙන් එතුමාට කර ඇති උපහාරය කාගේත් හදවත් සසල කළේ ය. රෝගාතුර වුවත් ඔහු සරසවියෙන් ඈත් වුයේ නැත. උපහාසාත්මක කවි ලීමෙහි උපනන්ද සහජ දස්කමක් දැක් විය.. ඔහු රෝහල්ගත වී සිටින විට සාත්තු සේවිකාවට පණිවිඩයක් දුන්නේ ය. ඒ මෙයයි.

මේ රෝහල් වැසිකිළිවල අපරි සෙත
කුණුවී තිබේ හොඳටම මගෙ ඉකිලි දෙක
බෙහෙතක් නොකළහොත් මතු වන විපත දැක
බීමටම වැටෙයි ළමයෝ මගෙ ඉතිරි ටික

එක් කවි මඩුවක දී බඹරකොටුවේ සුධර්ම හිමියන් උපනන්ද "බයිට්" එකට ගන්නට සැරසෙමින්දෝ කියු කවියක අග පදය මෙසේ විය.

කවුරුත් එකට අල්ලාගෙන තලමු බටු

ඔහු ඊට දුන් පිළිතුරේ අන්තිම පදය උපහාසාත්මක ව්‍යාංගාර්ථ වලින් පිරී ගිය එකක් විය.

**බටුගෙඩි තලන එක හිමියෙනි**
**ගැහැණු වැඩ**

උපනන්ද බටුගෙදර කවියා තුළ තිබුණේ උත්තරිතර මිනිස් කමකි. ආගන්තුක සත්කාරය කෙරෙහි ඔහු දැක් වූ ඇල්ම පුදුම එළවන සුළුය. යනු ගුණදාස ලියනගේ ගේ කියමනකි. උසස් කවියෙකු වුත් මානව දයාවෙන් හෙබි උතුම් චාම් පුරුෂයෙකු වුත් උපනන්ද බටුගෙදර කවියා ඉහත සඳහන් ලෙස සෑහෙන කලක් ගතින් දුබලව සිටියේ වුවද සිතින් ශක්තිමත් විය. ඔහුගේ පන්හිඳ කිසිදාකත් වියැලී නොගියේ එහෙයිනි. එය සුවිශේෂ කරුණක් වේ. සම්ප්‍රදාය රකිමින් සිංහල පද්‍ය සාහිත්‍යයේ දියුණුවට ඔහු කළ සේවාව අමිල බව අමුතුවෙන් කිය යුතු නොවේ.